**මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය**

**ஊடகத்துறை ஊழியர் தொழிற்சங்க சம்மேளனம்**

**FEDERATION OF MEDIA EMPLOYEES' TRADE UNIONS**

Reg. No. 6598 +94 (0) 773641111 +94 (0)11 2 324053 fmetu123@gmail.com fmetu.org


11/24/2025

සියලු මාධ්‍ය ප්‍රධානීන් වෙත,

**අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යොදා නීතිමය පියවර ගැනීමට විරෝධය පළ කරමු**

'අරුණ' පුවත්පතේ ප්‍රධාන කර්තෘ මහින්ද ඉලේපෙරුම මහතා අද (24) දින පෙරවරු 10.30 ට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවේ පෙනී සිටින ලෙස දන්වා තිබුණද, එම කැඳවීම ප්‍රතික්ෂේප කරමින් අද දින එම දෙපාර්තමේන්තුවට නොයෑමට ඔහු ගත් තීරණයට මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය සිය පූර්ණ සහාය පළ කර සිටී. මෙම කැඳවීම හුදු විමර්ශනයක් නොව, විමර්ශනයක මුවාවෙන් මාධ්‍ය බියවැද්දීම සඳහා ගත් උත්සාහයක් බව අප දැඩිව විශ්වාස කරන අතර, මෙවැනි ක්‍රියාවලට එරෙහිව ජාත්‍යන්තර මාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ සාමාජික සංවිධානයක් ලෙස නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මෙන්ම ජාත්‍යන්තර මට්ටමෙන් විරෝධය පළ කිරිමට අපි පසුබට නොවන බව අවධාරණය කරමු.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර පොලිස් අධිකාරි සේමසිංහ මහතා විසින් 2025 නොවැම්බර් 22 දිනැති ලිපිය මගින් ඉලේපෙරුම මහතා කැඳවා ඇත්තේ, 2025.11.19 දින අරුණ පුවත්පතේ පළ වූ "ග්‍රාම නිලධාරි සහතිකය මදි, පොලිස් වාර්තා ගන්න මහජන කමිටු ප්‍රධානීගේ අනුමැතියත් ඕනෑ" යන පුවත සම්බන්ධයෙනි. බරපතලම කරුණ වන්නේ, අදාළ ලිපියේ ශීර්ෂයේම එම පුවත 'අසත්‍ය පුවතක්' ලෙස හඳුන්වා තිබීමයි. විමර්ශනයක් ආරම්භ කිරීමටත් පෙර පොලීසිය විසින් ප්‍රවෘත්තියක් අසත්‍ය බවට නිගමනය කිරීම විමර්ශනයේ ස්වාධීනත්වය අභියෝගයට ලක් කරන්නකි. එසේම, එම ලිපියේ පැමිණිලිකරු කවුරුන්ද යන්න හෝ සඳහන් කර නොතිබීමෙන් පෙනී යන්නේ මෙය සැලසුම් සහගත මාධ්‍ය දඩයමක් බවයි.

ජනමාධ්‍ය අමාත්‍ය නලින්ද ජයතිස්ස මහතා මෙම පුවත අසත්‍ය බවත් ඊට එරෙහිව නීතිමය පියවර ගන්නා බවත් ප්‍රකාශ කර තිබුණි. එහෙත්, අදාළ පුවතේ අන්තර්ගත කරුණු නම් සහ ගම් සහිතව විපක්ෂය විසින් පාර්ලිමේන්තුවේදී තහවුරු කර තිබියදී, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දේශපාලන අවශ්‍යතා මත පුවත අසත්‍ය බවට පූර්ව නිගමනයකට පැමිණ කටයුතු කිරීම පිළිකුල් සහගතය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ බලතල සහ සීමා ජනමාධ්‍ය නියාමනය කිරීමට, ප්‍රවෘත්තිවල සත්‍ය අසත්‍යභාවය තීරණය කිරීමට හෝ මාධ්‍ය මගින් කීර්තිනාමයට වන හානි ගැන විමර්ශනය කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට බලයක් නොමැති බව අපි රජයට සිහිපත් කරමු. එසේම, මෙරට තුළ සාපරාධී අපහාස නීතියක් බලාත්මක නොවන බවද අවධාරණය කරමු.

මාධ්‍යවේදීන් නීතියට ඉහළින් නොසිටින බව අපි පිළිගනිමු. සැබෑ අපරාධ විමර්ශන සඳහා අප නිරන්තරයෙන් සහයෝගය ලබා දී ඇත.

2025.08.10 පිවිතුරු හෙළ උරුමය නායක උදය ගම්මන්පිල මහතාගේ ප්‍රකාශය සම්බන්ධයෙන් අගෝස්තු 18 සහ 19 දිනවල අරුණ කර්තෘ මණ්ඩල සාමාජිකයින් (මහින්ද ඉලේපෙරුම, මිහිරි ෆොන්සේකා, නිරෝෂා වාසල) සීඅයිඩීයට ගොස් ප්‍රකාශ ලබා දීමට කටයුතු කරන ලදී.

නාමල් රාජපක්ෂ මහතාගේ උපාධි සහතිකය පිළිබඳ හෙළිදරව්ව සම්බන්ධයෙන් මාධ්‍යවේදිනී නිර්මලා කන්නංගර පසුගිය සතියේ සීඅයිඩීයට ගොස් සහයෝගය ලබා දීමට කටයුතු කළාය.

මෙම උදාහරණ මගින් තහවුරු වන්නේ අප විමර්ශන මගහැරීමට උත්සාහ නොකරන බවයි. එහෙත්, දේශපාලන අවශ්‍යතා මත 'අසත්‍ය ප්‍රවෘත්ති' යන ලේබලය අලවා සිදුකරන බියවැද්දීම්වලට හිස නැමීමට අපි සූදානම් නැත.

මාධ්‍ය මර්දනයට එරෙහිව ඍජුව නැගී සිටින ලෙසත්, තර්ජන හමුවේ තම වෘත්තීය ගෞරවය ආරක්ෂා කරගන්නා ලෙසත් අපි සමස්ත මාධ්‍ය ප්‍රජාවගෙන් ඉල්ලා සිටිමු.

ස්තුතියි,



තරිඳු උඩුවරගෙදර
ලේකම්, මාධ්‍ය සේවක වෘත්තිය සමිති සම්මේලනය